## ගුවන්තොටුපළ සුඛෝපභෝගී විවේකාගාර  ප්‍රවේශ පහසුකම

- පරිශීලක මාර්ගෝපදේශය

## පරිශීලක මාර්ගෝපදේශය සහ නිතර අසනු ලබන ප්‍රශ්ණ (FAQ)

---

### 1. LoungeKey කියන්නේ කුමක්ද?

LoungeKey යනු ගුවන් තොටුපළ විවේකශාලා (Airport Lounges) සඳහා ප්‍රවේශය ලබා දෙන වැඩසටහනකි. මේ වැඩසටහන ඔස්සේ, ප්‍රථමික Peoples Bank ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සහ ඔවුන්ගේ ආරාධිතයන් (Guest) තමන්ගේ වලංගු Peoples Bank ක්‍රෙඩිට් කාඩ්පත පෙන්වා විවේකාගාරයට ප්‍රවේශ විය හැකිය.

අමතර සාමාජික කාඩ්පතක් අවශ්‍ය නැත.

සුදුසු කාඩ්පත්:

- VISA Elegance Infinite
- VISA Excelsior
- VISA Signature
- MasterCard World

සේවා සහාය ලබා ගැනීම සඳහා පහත LoungeKey වෙබ්අඩවි හෝ ජංගම යෙදුම භාවිතා කරන්න:

- Visa Elegance Infinite: www.loungekey.com/Peoplesbankelegance
- Visa Excelsior / Signature: www.loungekey.com/peoplesbank
- MasterCard World: www.loungekey.com/mastercardsa

---

### 2. LoungeKey භාවිතා කිරීමට පෙර ලියාපදිංචි විය යුතුද?

ඔබේ සුදුසු Peoples Bank ක්‍රෙඩිට් කාඩ්පත දැනටමත් LoungeKey සමඟ ලියාපදිංචි වී ඇත.

කෙසේ වෙතත්, ඔබේ ගමන් සැලසුම් පහසු කර ගැනීම සඳහා LoungeKey යෙදුම හෝ වෙබ් අඩවිය හරහා ස්වයං ලියාපදිංචිය (self-onboarding) කිරීම අවශ්‍ය වේ.

මෙය ඔබට පහත දේ ලබා දේ:

- විවේකශාලා සොයා බැලීම
- පහසුකම් හා නීති බලන්න
- ගමන් පිළියෙල කිරීම පහසු කර ගැනීම

අදාළ වෙබ් අඩවියන් සදහා පිවිසෙන්න (උපරිම පහසුව සඳහා).

---

**3. LoungeKey මගින් ලබා දෙන වාසි මොනවාද?**

සුදුසු Peoples Bank ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන්ට පහත වාසියන් හිමිවේ:

- වසරකට නොමිළේ විවේකාගාර ප්‍රවේශවීම් 2ක් (Free Lounge Visits)
  (කාඩ්පත් හිමියාට සහ ආරාධිතයෙකුට එක් පැමිණීමක් ලෙස සලකා බැලේ)
- අමතර පැමිණීම්:
  නිදහස් පැමිණීම් 2 කට වඩා වැඩි පැමිණීම් සදහා USD 35ක් එක් පුද්ගලයෙකුට, එක් පැමිණීමක් සදහා ඔබේ ක්‍රෙඩිට් කාඩ්පතට වහාම අයකරනු ලැබේ.
- විවේකශාලා පහසුකම් සහ නියමයන්:
  පහසුකම් සහ නීති විවේකශාලාව මත රඳා පවතින අතර, ඒවා LoungeKey වෙබ්අඩවිය/යෙදුම ඔස්සේ සොයා බැලිය හැක.
  Peoples Bank එකට මෙම පහසුකම් හා නීති පිළිබඳව පාලනයක් නොමැත.

✅ විවේකශාලාවට යාමට පෙර LoungeKey යෙදුම හෝ වෙබ් අඩවිය හරහා:

- විවේකශාලා සොයන්න
- පහසුකම් බලන්න
- නීති නියමයන් පරීක්ෂා කරන්න
- LoungeKey මගින් මෙම සේවාව ලබා දෙන බව ඇතුල් වීමේ දොරටුව අසලදී පවසන්න

---

තවත් උදව් අවශ්‍ය නම්, ඔබේ කාඩ්පතට අදාළ LoungeKey වෙබ් අඩවිය හරහා විමසන්න හෝ Peoples Bank සේවා අංශය අමතන්න.

## LoungeKey සඳහා ලියාපදිංචි වීම / ගිණුමක් සාදන ආකාරය

---

### පියවර 01:

**LoungeKey** ජංගම යෙදුම (App) **Google Play Store** හෝ **Apple App Store** හරහා බාගන්න **හෝ**
වෙබ්අඩවියට පිවිසෙන්න: www.loungekey.com

### පියවර 02:

**පරිශීලක නාමයක් (User Name)** සහ **මුරපදයක් (Password)** තනන්න.




Create Username / Password




**පියවර 03:**

ඔබගේ **ක්‍රෙඩිට් කාඩ්පතේ විස්තර** ඇතුළත් කරන්න
ඔබේ කාඩ්පත LoungeKey සඳහා **ලියාපදිංචි කිරීම සනාථ කරන්න** (Validate).



**පියවර 04:**

ඔබගේ **නගරය / ගුවන් තොටුපළ නම හෝ කේතය** (City / Airport Name / Code) ඇතුළත් කරන්න
ප්‍රවේශය ලබා දෙන **විවේකශාලා (Lounges)** සොයා බැලීම සඳහා.






**පියවර 05:**

අදාළ **ගුවන් ටර්මිනලය (Airport Terminal)** තෝරන්න.




---

**පියවර 06:**

අදාළ විවේකශාලාව මත **දෙවරක් ක්ලික් කරන්න**
ඔබට ලැබිය හැකි **පහසුකම්**, **නියමයන් සහ කොන්දේසි** නැරඹීමට.






✈️ සටහන: ලියාපදිංචිය සම්පූර්ණ වූ පසු, LoungeKey යෙදුම හෝ වෙබ්අඩවිය භාවිතයෙන් ඔබට පහසුවෙන්

- ලැබිය හැකි නිදහස් lounge පැමිණීම් සංඛ්‍යාව
- ලැබිය හැකි lounge
- පහසුකම් හා නියමයන් පරීක්ෂා කළ හැක.

---

විශේෂ සටහන:

- ඔබට හිමි නොමිළේ විවේකශාලා පැමිණීම් 2 කට අමතරව වැඩි පැමිණීම් සඳහා, එක් පුද්ගලයෙකුට එක් පැමිණීමකට USD 35ක් ලෙස ඔබගේ ක්‍රෙඩිට්කාඩ්පතට අයකෙරේ.
- ප්‍රාථමික ක්‍රෙඩිට් කාඩ්පත් හිමිකරුට සහ ඔහු/ඇයගේ ආරාධිතයෙකුට පමණක් වසරකට නිදහස් පැමිණීම් 2 හිමිවේ.
- කාඩ්පත තහවුරු කිරීම සඳහා USD 1ක් අයකරනු ලැබේ, එය පසුව ඔබගේ කාඩ්පතට ආපසු භාරදෙයි.

---

**5. Lounge එකට ප්‍රවේශ වීම කොහොමද?**

✅ **පියවර 01:**
**Q1** හි සඳහන් වෙබ් අඩවි හෝ ජංගම යෙදුම භාවිතයෙන්
ඔබට ලබා ගත හැකි විවේකශාලා පරීක්ෂා කරන්න.

✅ **පියවර 02:**
විවේකශාලාවට පැමිණි විට,
ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පත (VISA Infinite, VISA Signature, MasterCard World),
Boarding Pass එක සමඟ ඉදිරිපත් කරන්න
ඔබ LoungeKey සාමාජිකයෙකු බව සනාථ කරන්න.

✅ **පියවර 03:**
ඔබේ කාඩ්පත **swipe (ස්වයිප්)** කරනු ලැබේ:

- සුදුසුකම් තහවුරු කිරීමට
- ඔබේ පැමිණීම ලියාපදිංචි කිරීමට
- අවශ්‍ය නම් lounge ගාස්තු අය කිරීමට

✅ **පියවර 04:**
ඔබේ කාඩ්පත විවේකශාලාවේ ස්වයිප් කළ පසු,
ඔබගේ දුරකථනයේ Roaming සක්‍රිය වී ඇත්නම්,
USD 35ක් ලෙස lounge ගාස්තුවක් පිළිබඳව SMS පණිවිඩයක් ලැබෙනු ඇත.
කෙසේ වෙතත්,

මෙම ගාස්තුව ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත් පිළිවෙලේ (statement) දිස් නොවනු ඇත,
ඒ නිසා එය ස්වයන්ක්‍රීයව අහෝසි කෙරේ (වරෙකට නිදහස් පැමිණීම් 2ක් පමණි).

✅ සටහන:
වසරකට නිදහස් පැමිණීම් 2ක් පමණක් වලංගු වේ.
ඒකට අමතරව පැමිණීම් සඳහා:
එක් පුද්ගලයෙකුට එක් පැමිණීමකට USD 35ක් හෝ lounge ගාස්තු අයකෙරේ.